Article 13(2).


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019-04-04

පැමිණිලිකරු : ඒ. ධර්මසිරි මයා,
ඉසුරුපාය, දෙනගම,
හක්මන.

වගඋත්තරකරු : උ.පො.ප. ජයමහ මයා,
පොලිස් ස්ථානය,
තලංගම,

**පැමිණිලි අංක : HRC/1936/16 + HRC/2018/16**

පැමිණිලිකරුගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා කොළඹ මරදාන ප්‍රදේශයේ හෝටලයක රැකියාව කරන බවත්, 2016.05.02 දින රාත්‍රී 9.10 ට සේවය නිම වී තමාගේ නවාතැන පිහිටි මීගොඩ ප්‍රදේශයට යාමට පිටත් වී රාත්‍රී 10.15 ට බත්තරමුල්ල, කොස්වත්ත හන්දියෙන් බැස විදේශ සේවා නියුක්ති කාර්යාංශය අසල වැඩබිමක ආපන ශාලාවක් පවත්වාගෙන යනු ලබන රුවන් නැමැති මිතුරා හමුවීමට ගොස් රාත්‍රී 12.00 ට පමණ මීගොඩ දක්වා යන අවසන් බසය බලාපොරොත්තුවෙන් කොස්වත්ත හන්දියේ සිටි බවත්, රාත්‍රී 12.10 ට පමණ එම ස්ථානයට තලංගම පොලිස් ස්ථානයේ කැබ් රථයක් පැමිණි අතර එහි සිටි ඉහත වගඋත්තරකරු වන උ.පො.ප ජයමහ මහතා විසින් තමාට කථා කර "උඹ මොකද මෙතන කරන්නේ යැයි විමසූ බවත්" එහිදී තමා සිද්ධිය පවසා තම නිලඇඳුමද පෙන්වූ නමුත් ඔහු "බොරු කියන්න එපා යකෝ, මේ වේලාවට කොහෙද මීගොඩ බස්, වරෙන් යන්න" යැයි පැවසූ බවත් සඳහන් කර ඇත. එම නිළධාරි එම අවස්ථාවේ බීමත්ව සිටි බවට තමාට නිරීක්ෂණය වූ බවත්, තමා ඔහුට සපෝර්ට් කරන්නේ නම් කූඩුවට නොදා මුදා හැරිය හැකි බව ඔහු විසින් තමා වෙත පැවසූ නමුත් තමා එය ප්‍රතික්ෂේප කළ විට "උඹේ කට වැඩියි පවසා" තම ජංගම දුරකථනයෙන් හමුවූ මිතුරාට කථා කිරීමට උත්සහ කළද අවස්ථාව ලබා නොදී ජංගම දුරකථනය ලබා ගත් බවත් සඳහන් කර ඇත. එසේම තමා විසින් ඉදිරිපත් කරන ලද ජාතික හැඳුනුම්පතද ප්‍රතික්ෂේප කළ බවත්, තමා හැඳ සිටි කළු ඇඳුමද සැකසහිත බව දක්වා පොලිස් ස්ථානයට ගෙන ආ බවත්, එහිදී සිර මැදිරියට දැමීමට පෙර තමාට පහරදීමට




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 011-2505575 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

සැරසීමේදී තමා ලෙඩක් බව පැවසීම නිසා පහර නොදුන් අතර, පසුදින උදේ දහවල් කිසිදු ආහාරයක් නොදුන් බවත්, සඳහන් කර ඇත.

පසුව රාත්‍රි 8.00 ට පමණ ජංගම දුරකථනය ලබාදීම මත, තමා මඟදී හමුවූ මිතුරාගේ අංකයට පොලිස් ස්ථානයේදීම දුරකථන ඇමතුමක් ලබාදුන් අතර, රාත්‍රි 8.20 ට පමණ ඇප මත නිදහස් කළ බවත්, දන්වා ඇති අතර, තමා විසින් මේ පිළිබඳ පොලිස් මූලස්ථානයට හා නියෝජ්‍ය පොලිස්පති වෙත දැනුම් දුන් බවත් දක්වා සඳහන් කර ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම ::

පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින්, වගඋත්තරකාර උ.පො.ප ජයමහ මහතා ප්‍රකාශ කර ඇත්තේ, තමා 2015.05.02 දින ස්ථානාධිපතිතුමාගේ නියෝග පරිදි ජංගම රාජකාරි සිදු කළ අතර, රාජකාරි අතරතුර පැය 12.00 ට පමණ බත්තරමුල්ල හන්දිය ආසන්නයේ කඩ කාමරයක් අසල පුද්ගලයකු සිටි බවත්, ඔහුගෙන් තොරතුරු විමසිමේදී මීගොඩ යන අතරතුර තම මිතුරෙකු හමුවීමට ගිය බවට ප්‍රකාශ කළ නමුත් ඔහු විසින් පැහැදිලි ලෙස සිය විස්තර නොපැවසූ බවත්, ඔහුගේ ඉතා බියමුසු හා වචන පැටලෙන සුළු ස්වාභාවයක් තිබූ බවත්, ජාතික හැඳුනුම්පත විමසූ විට එය ඉදිරිපත් කිරීමට අසමත් වූ බවත්, එසේම යහළුවා තමා මුණගැසීමට මෙතනට පැමිණෙන බවත්, පසුව යහළුවා මුණ ගැසීමට ඔහු ගිය බව දක්වා සිටි බවත්, ඒ අනුව ඔහුගේ හැසිරීමේ සැකසහිත බව හා අනන්‍යතාවයක් නොමැති වීම මත මොහු අපරාධයක් සිදු කිරීමට සැරසෙනවාද යන සැකය මතත්, බත්තරමුල්ල මාලඹේ ප්‍රදේශවල ගෙවල් බිඳුම් රාශියක් රාත්‍රි කාලයේ සිදු වූ නිසා ද මොහු පිළිබඳ ඇති වූ සැකය මත වරද කියා දී අත්අඩංගුවට ගත් බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරුගෙන් හමුවූ මිතුරා පිළිබඳව සා දුරකථන අංකය සහ නිවැසියන් පිළිබඳවත් විමසීම කළද, ඔහු උත්තරදීමට බැඳි නොමැති බවට සඳහන් කරමින් නිළධාරීන් නොසලකා හැරීමක් කළ බවට හැඟී ගිය බවද වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීමේදී සඳහන් කර ඇත.

මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය ::

පැමිණිලිකරු මූලිකවම මෙම පැමිණිල්ල මඟින් කොමිෂන් සභාව හමුවේ ගෙනහැර දක්වා ඇත්තේ, කිසිදු සාධාරණ හේතුවකින් තොරව තමාව අත්අඩංගුවට ගෙන පැය 20 කට ආසන්න කාලයක් රඳවා සිටි බවයි. ඒ අනුව අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 32(ආ) වගන්ති ප්‍රකාරව සාධාරණ සැකයකට ඔත්තුවකට පැමිණිල්ලකට පුද්ගලයකු අත්අඩංගුවට ගත හැකි වන අතර, එය සාධාරණ විය යුතු බවට දක්වා ඇත.

මෙහිදී වගඋත්තර පාර්ශවය දන්වා ඇත්තේ, මෙම පුද්ගලයා රැඳී සිටි වේලාව, අනන්‍යතාවය ඔප්පු නොකිරීම හා කරුණු පැහැදිලිව නොදැක්වීම මත සාධාරණ සැකය මත අත්අඩංගුවට ගත් බවයි. ඒ අනුව පැමිණිලිකරු මිතුරෙකු මුණගැසී රාත්‍රි 12.00 ට එම ස්ථානයේ සිටි බවත්, අනන්‍යතාවය ඉදිරිපත් කිරීමට තමා හැඳුනුම්පත ඉදිරිපත් කළද, ඔවුන් එය ප්‍රතික්ෂේප කළ බවත්, මිතුරාට දුරකථන ඇමතුමක් දීමට උත්සහ කළද, ජංගම

දුරකථනය තමාගෙන් ලබා ගත් බවත් දක්වා ඇත. 2016.11.11 දින කොමිෂන් සභාවේදි පැමිණිලිකරු ලබාදුන් ප්‍රකාශයේ දක්වා ඇත්තේ ඔවුන්ට හැඳුනුම්පත ලබා දුන්නද එය ප්‍රතික්ෂේප කරන ලද බවට වේ. එහිදී පැමිණිලිකරු විසින් කොමිෂන් සභාවට පරස්පර ප්‍රකාශ ලබා දී ඇති බව නිරීක්ෂණය වන අතර, මෙහිදී පැමිණිලිකරු සිය අනන්‍යතාවය නිසියාකාරව තහවුරු කිරීමට අසමත් වූවාද යන ගැටළුව උද්ගත වේ. එසේම, වගඋත්තර පාර්ශවයද නිසි ප්‍රශ්න කිරීමක් කළේ නම් හා ජංගම දුරකථනය පරීක්ෂා කළේ නම් අනන්‍යතාවය තහවුරු කිරීමේ හැකියාව තිබූ බව නිරීක්ෂණය වේ

එසේම, පැමිණිලිකරු දක්වා ඇත්තේ දීර්ඝ ප්‍රකාශයකට අත්සන් ගැනිමත් පැය 20 ක් පමණ ස්ථානයේ රඳවා ආහාර ලබා දීමක් හෝ නොකිරීම මගින් තමන් මානසික පීඩනයකට ලක් වූ බවයි. එහිදී එම රඳවා ගත් කාලය පිළිබඳ සැලකීමේදි යම් විමර්ශනයක් සිදු කළේ නම් එම රඳවා ගත් කාලය සාධාරණීකරණය කළ හැකි නමුත් පැමිණිලි පාර්ශවය සම්බන්ධයෙන් එවැනි විමර්ශනයක් කළබවට කිසිදු සාක්ෂි අනාවරණය වීමක් සිදු නොවන අතර, පැමිණිලිකරු රාත්‍රී 8.20 ට මුදාහරිනුයේ ඔහුගේ ජංගම දුරකථනයේ තිබූ අංකයකට දුරකථන ඇමතුමක් පොලිස් ස්ථානයේ දුරකථනයෙන් ලබාදීමෙන් අනතුරුව බව නිරීක්ෂණය වේ.

එසේම මෙම පැමිණිලිකරුගේ ප්‍රකාශයක් 2016.05.03 දින ලබා ගැනීමෙන් අනතුරුව කිසිදු විමර්ශනයක් සිදු නොකර 2016.05.03 දින ප.ව. 8.30 දක්වා රඳවා ගැනීම සාධාරණ නොවන බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි.

නිගමනය :-

ඒ අනුව පැමිණිලිකරු රඳවා ගැනීම ප්‍රශ්න සහගත වන අතර එය අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 37 වගන්ති ප්‍රකාරව "වරෙන්තු නොමැතිව සිර භාරයට ගනු ලැබූ තැනැත්තකු අවස්ථාගත සියලු කරුණු අනුව යුක්තිසහගත කාලයකට වඩා දීර්ඝ කාලයක් අත්අඩංගුවේ රඳවා ගැනීම හෝ අන් ලෙසකින් අත්අඩංගුවේ රැඳවීම කිසිම සාම නිළධරයකු විසින් නොකළ යුතු බවත්, ඒ සිරභාරයට ගැනීම සිදු කළ ස්ථානයේ සිට මහේස්ත්‍රාත්වරයා වෙත යාමට අවශ්‍ය කාලය අතරතුර ගණන් බැලිය යුතු පැය විසිහතරක කාලය නොඉක්මවිය යුතු" බවට දක්වා ඇත. නමුත් මෙහිදි මෙම පැමිණිලිකරු යුක්ති සහගත කාලයකට වඩා රඳවා ගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාවේ (2) වගන්තියෙන් තහවුරු කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වගඋත්තර පාර්ශවය වසින් සිදු කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. වගඋත්තරකාර උ.පො.ප ජයමහ නිලධාරී විසින් පැමිණිලිකරු වෙත රු. 8,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතුය.

02. වගඋත්තර පාර්ශවයේ මෙම ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති, නීතිපති, සහ පොලිස් කොමිෂන් සභාව වෙතද යොමු කරනු ලැබේ.

2019.05.10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 01. පොලිස්පති.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

02. නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව.
කොළඹ 12.

03. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 08.

B/